මදීනාව ‘ඊර්’ හා ‘සව්ර්’ දක්වා අතර වන කොටස ශූද්ධ භූමියයි. කවරෙකු එහි කිලිටක් කළේ ද එසේ නැතහොත් කිලිටක් වෙත පැමිණියේ ද ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ද මලක්වරුන්ගේ ද සියලු මිනිසුන්ගේ ද ශාපය අත් වේවා. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු හැරීමක් හෝ වන්දියක් හෝ අල්ලාහ් පිළිගන්නේ නැත.

යසීද් ඉබ්නු ෂරීක් ඉබ්නු තාරික් විසින් වාර්තා කරන ලදී. මම අලී (රළියල්ලාහු අන්හු) තුමා වේදිකාවට නැග දේශනා කරමින් සිටිනු දුටුවෙමි. එතුමා කරමින් සිටි ප්රකාශයට මම සවන් දුනිමි.: “නැත, අල්ලාහ් මත දිවුරා පවසමි. අල්ලාහ්ගේ ග්රන්ථයෙන් මෙය මිස අප කියවන වෙනත් ග්රන්ථයක් නොවීය. යැයි පැවසීය. පසුව මෙම පත්රිකාවේ ඇති දෑ එතුමා ප්රකාශ කළේය. එවිට එහි: ඔටු දත් හා වෙනත් තුවාල හා සම්බන්ධ කරුණුවල නීති සදහන්ව තිබිණි. තවදුරටත් එහි අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ දෑද විය. “මදීනාව ‘ඊර්’ හා ‘සව්ර්’ දක්වා අතර වන කොටස ශූද්ධ භූමියයි. කවරෙකු එහි අලුත් දෙයක් බිහි කළේ ද එසේ නැතහොත් අලුත් දෙයක් වෙත පැමිණියේ ද ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ද මලක්වරුන්ගේ ද සියලු මිනිසුන්ගේ ද ශාපය අත් වේවා. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු හැරීමක් හෝ වන්දියක් හෝ අල්ලාහ් ඔහුගෙන් පිළිගන්නේ නැත. මුස්ලිම්වරුන්ගේ වගකීම එකකි. ඔවුන්ගෙන් පහළම අය ද ඒ සඳහා වෙහෙසෙයි. කවරෙකු හෝ මුස්ලිම්වරයකු හුදකලා කරන්නේ ද ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ද මලක්වරුන්ගේ ද සියලු මිනිසුන්ගේ ද ශාපය අත් වේවා. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු හැරීමක් හෝ වන්දියක් හෝ අල්ලාහ් ඔහුගෙන් පිළිගන්නේ නැත. කවරෙකු තම පියා නොවන කෙනකු වෙත පීතෘත්තවය වාද කරන්නේ ද එසේ නැතහොත් ඔහුගේ භාරකාරත්වය නොවන අය වෙත භාරකාරත්ව ඈදන්නේ ද ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ද මලක්වරුන්ගේ ද සියලු මිනිසුන්ගේ ද ශාපය අත් වේවා. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු හැරීමක් හෝ වන්දියක් හෝ අල්ලාහ් ඔහුගෙන් පිළිගන්නේ නැත.
[පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

අලී (රළියල්ලාහු අන්හු) තුමා වේදිකාව මතට නැග මෙසේ පැවසීය. “අල්ලාහ් මත දිවුරා පවසමින් අප කියවීම සඳහා අල්ලාහ්ගේ ග්රන්ථයෙන් මෙම ග්රන්ථය හැර වෙනත් ග්රන්ථයක් නොවීය. පසුව එය ඔහු දිග හැරියේය. එහි ඔටු දත් සඳහා වූ වන්දියක් තිබුණි. තුවාල හා සම්බන්ධ ගැටලු හා ඒවායෙහි නීතිද තිබුණි. එහිදී සැබැවින්ම මක්කාව මෙන්ම මදීනාව ඊර් කන්දේ සිට සව්ර් කන්ද දක්වා අතර ස්ථානය ශුද්ධ භූමිය වේ. කවරෙකු දහමේ අලුත් කටයුත්තක් මෙහිදී ආරම්භ කළේ ද එසේ නැතහොත් මුස්ලිම්වරුන්ට වැරදි හා අපරාධ කිරීමෙන් හිංසාවක් ඇති කිරීමට හේතුවක් වූයේ ද එසේත් නැතහොත් (දහමේ නොමැති) නව කටයුත්තක් වෙත පැමිණියේ ද ඔහුට ආශිර්වාදය වළක්වනු ලබමින් අල්ලාහ්ගේ ශාපය ඔහු මත වනු ඇත. උත්තරීතර අල්ලාහ්ගෙන් වූ එම ශාපයට මලක්වරුන් හා සෙසු මිනිසුන් සියලු දෙනාගේ ප්රාර්ථනාවද වනු ඇත. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු අනිවාර්යය කටයුත්තක් හෝ අමතර කටයුත්තක් හෝ පාපොච්චරණයක් හෝ වන්දියක් හෝ පිළිගනු නොලබනු ඇත. මුස්ලිම්වරයකු දේව ප්රතික්ෂේපකයකුට පිරිනමන

ආරක්ෂාව ඇතැම් නිවැරදි කොන්දේසි මත වලංගු වන්නේය. නමුත් එවැන්නක් කඩ කරනු දුටුවේ නම් ඔහුට එය ඉදිරිපත් කිරීම තහනම් වන්නේය. ඒ අනුව කවරෙකු හෝ මුස්ලිම්වරයකුට ආරක්ෂාව සැලසීම කඩ කළේ ද එමෙන්ම ආරක්ෂාව සැළසූ දේව ප්රතික්ෂේපකයාට බාධා පමුණුවන්නේ ද ඔහුට හිමි ආශිර්වාද වළක්වමින් අල්ලාහ් ඔහු කෙරෙහි ශාප කරනු ඇත. අල්ලාහ්ගෙන් වූ එම විෂයයට මලක්වරුන් හා මිනිසුන් සියලු දෙනාගේ ප්රාර්ථනාව ද හිමි වනු ඇත. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු අනිවාර්යය කටයුත්තක් හෝ අමතර කටයුත්තක් හෝ පාපොච්චරණයක් හෝ වන්දියක් හෝ පිළිගනු නොලබනු ඇත. පියා නොවන කෙනෙකු වෙත තම පෙළපත ඈදා පවසන්නේ ද එසේ නැතහොත් ඔහුගේ භාරකරු නොවන කෙනෙකු වෙත සම්බන්ධ කරන්නේ ද ඔහුට හිමි ආශිර්වාදය වළක්වාලමින් අල්ලාහ්ගේ ශාපය ඔහු මත වනු ඇත. එමෙන්ම මලක්වරුන් හා සෙසු සියලු මිනිසුන් අල්ලාහ්ගෙන් එය පතනු ඇත. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ කිසිදු අනිවාර්යය කටයුත්තක් හෝ අමතර කටයුත්තක් හෝ පාපොච්චරණයක් හෝ වන්දියක් හෝ පිළිගනු නොලබනු ඇත. එය එහි ආශිර්වාදය ප්රතික්ෂේප කළ බැවිනි. එමෙන්ම එහි කඩකරමින් හා දඬුවම් පමුණුවමින් උරුමය, භාරකාරත්වය, බුද්ධිය හා වෙනත් දෑ විනාශ කළ බැවිනි.

http://www.sunnah.global/hadeeth/si/show/6381